# රංගන - උදුම්බරා නර්තන කණ්ඩායමෙන්

## රංගාභිෂේක 5 - 2016



යම් විෂයක ශිල්පීය අධ්‍යාපනය යනු වෙනමම ක්ෂේත්‍රයකි. න්‍යායික සිද්ධාන්ත මත පිහිටා උගෙන ගන්නා දේ ඒ විෂය පිළිබඳව දැනුම පුළුන් කරවයි. ශිල්පීය නිපුනතාව වෙනමම අංශයකි. සතත අභ්‍යාසයෙන් ලද පරිචය නිසා-වෙන්ම දිනෙන් දින වැඩි දියුණු වන ශිල්පීය හරඹයයි ඒ. ජන්මයෙන් ලද නිසග කුසලතාවයන් ඔබ කරවන අධ්‍යාපනය නැතහොත් ව්‍යුත්පත්තියන්, සතත අභ්‍යාසයෙන් එක් තැන් වූ කල නියම ශිල්පියෙකු බිහි වෙයි. එයින් ම නියම ශිල්පය කලින් කලට වැඩි දියුණු වෙමින් පවතියි.

මෙවන් පූර්විකාවක් සැකයකින් තොර ලිවිය හැකි ශිල්වීන් යුවලක් පිළිබඳවයි මේ සටහන.

ප්‍රධාන ප්‍රවාහය වෙත ඉදිරිපත් කිරීමට රංගන , උදුම්බරා යුවල ගත් උත්සාහය ප්‍රශංසනීයයි.

මෙවර පැවැත්වීමට සංවිධානය කෙරෙන රංගාභිෂේක 5 පැවැත්වෙන්නේ වෙසක් මා-සයේයි. අප මහා බුදුරජාණන් වහන්සේ වෙතින් බණ අසා ප්‍රථම වරට බොදු දහම වැළඳගත් රත්නපුර මහ සමන් දේවාල අධිපති සුමන සමන් දෙවියන් සිහිගන්වන නර්තන අංග සමගින් වෙසක් සමටය අදාල අංග කීපයකින්ම රංගාභි-ෂේක 5 සැරසෙයි. අපගේ සාම්ප්‍රදායික නර්තන අතරේ සබරගමු සම්ප්‍රදායට අයත් නර්තන අංක පෙළගැනවෙන්නේ බොහේ විට අප හට මග හී යන එකී සම්ප්‍රදාය සිහිගැන්වීමේ අරමුණින්.



මේ යුවල රංගන, උදුම්බරා නම් වෙති. ශිල්පය නම් නර්තන ශිල්පයයි. ඔහු රංගන රතනතුංගයි. උදුම්බරා ඔහුගේ පිය බිරිඳයි.

මෙල්බන් හි ඩීකින් හා වික්ටෝරියා විශ්ව විද්‍යාල වලින් ව්‍යාපාර කළමණාකරණය හා වෘත්තීය ගණකාධිකරණය පිළිබඳව පශ්චාත් උපාධි ලබා මෙරට සුදුසුකම් සපුරාගන්නා රංගන පේරා-දෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳව උපාධිධරයෙකු වන අතර, නීති විද්‍යාලයේත් නීතිඥවරයෙකු ලෙසින්ද උසස් අධ්‍යාපනය නිම කල වෘත්තිකයෙකි. මානව සම්පත් කළමණාකාරුවකු ලෙස මව්බිමේ රැකියාව කළ රංගන 2003 වසරේ මෙල්බන් නුවරට සංක්‍රමණය වීමෙන් අනතුරුව බැංකු කළමනාකරුකෙලෙස සේවය කරයි.




රංගන වින්‍යාසය :කයදරුදටර්වයහ* පශ්චාත් උපාධීය මෙල්බන් විශ්ව විද්‍යාලයේ ''වික්ටෝරියා කොලේජ් ඔෆ් ද ආට්ස්'' ආයතනයෙන් ලබා මෙහි සුසුදුකම් සපුරාගත් උදුම්බරා ඉන්දියාවේ භාත්ඛණ්ඩේ විශ්ව විද්‍යාලයෙන් භාරත නාට්‍ය විශාරද උපාධිය ලබා ගත් ශිල්පිනියකි.

ඒ ඇයගේ ශ්‍රී ලංකාවේ සෞන්දර්ය විශ්විද්‍යාලයේ ''ෆයින් ආට්ස්'' උපාධියට අමතරවයි. ජනාධිපති ශිෂ්‍යත්ව ලාභීන් ලෙස වසර 2003 දී මෙරටට පැමිණි රංගන , උදුම්බරා යුවල පසුගිය වසර 14 පුරා මෙහි උපන් අපගේ දරු දැරියන් සියගණනකට සිය ශිල්පය දායාද කරමින් සිටිනා නර්තනාචාර්ය යුවලකි.

වසර 2015 අයි.සී.සී. ක්‍රිකට් ලෝක කුසලාන සමා-ාරම්භක උළෙලේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ''සිඩ්නි මයර් මියුසික් බෝල්'' හි කළ සුවිශේෂී නර්තනය රංගන , උදුම්බරා යුවලගේ නිර්මාණ වසර 2014 දී පැවැත්වූ කළඑළි මංගල්‍යයේදී තමන් යටතේ වසර දහයක් පුරාවට නර්තනය හැදෑරූ සිසුවියන් දස දෙනෙකු එළි දැක්වීම මෙල්බන් ඉතිහාසයට සෞන්දර්යාත්මක සිහිවටනයක් එක් කිරීමට ඔවුහු වාසනාවන්ත වූහ. සර 2008 දී ඕස්ට්‍රේලියානු නර්තන සම්මාන උළෙලේ අවසන් කණ්ඩායම් පහට තේරීම ඔවුන්ගේ ගමනේ තවත් එක් වැදගත් මතක සටහනකි. ''මල්ටි කල්චරල් ආර්ට්ස් ඕස්ට්‍රේලියා'' :එමකඑසප්මකඑමර්ක ්රචී ්මීඑර්කස්* සංවිධා-නයේ ප්‍රසංග හා උත්සව වලට ශ්‍රී ලංකා නියෙ-ා්ජනය ලෙස අපේ බෙර හඬ මා නර්තන මෙරට

සුමන සමන් දෙවියන්ගේ අඩවිය වන්නේද සබරගමුවයි. සබරගමු නර්තන චමත්කාරය මුහු නිර්මාණය වූ සමන් දෙවි වන්නම, සමන් දෙවි බිසෝ නර්තනය මෙන්ම අද න විට අභාවයට යමින් පවතින මහ සමන් දේවාලයේ දිග්ගෙයි නැටම සහ සමන් දෙවි පෙරහැර පිළිබඳව කිය-වෙන නැටුම් අංග රසික ප්‍රේක්ෂකයින්ට වෙනසකතින් යුත් ප්‍රසංගයක් වෙනුවෙන් කරනා ඇරයුමක් වැන්න.

අපගේ සිංහල අවුරුදද පසු ගිය මාසයට යෙදී තිබුණද ඒ ඇසුරින් සකස් කළ නර්තන අංග, අපගේ පෙරහැර සිහිකරවන අංග, ඉන්දීය ශාස්ත්‍රිය ශරත නාට්‍ය නර්තනය මෙන්ම බටහිර ලතින් ඇමෙරිකානු නර්තන අංගයද රංගාභි-ෂේක 5 ප්‍රසංගයට විවිධත්වය මුහු කරවනු ඇත. එමෙන්ම නර්තනායතනයෙන් වසර දහයකට වැඩි කලක් නර්තනය හදාරා එළි දුටු ශිල්ප-නියන් දස දෙනා විසින්ම නිර්මාණය කරගත් අංගයද වෙනස් වන ලොව තුල අපේකම රැකගෙන ඉදිරියට යමින් ඊට මුහුවන අන්දම පෙන්වා දෙන්නකි. අතීත, වර්තමාන හා අනාගත කාලත්‍රයම ආවරණය වන සේ ප්‍රසංගය නැරඹීමට පැමිණෙන බාල , තරුණ, වියපත් සියලු දෙනාටම උචිත ප්‍රසංගයක් පිරිනැමීම රංගන , උදුම්බරා නර්තාචාර්ය යුවලගේ අරමුණයි.

දුවා දරුවන් සියයකට අධික ප්‍රමාණයක් සහභාගී වන රංගාභිෂේක ප්‍රසංගය වෙනුවෙන් දෙමව්පියන්ගේ දායකත්වය හා කැපවීම රංගන, උදුම්බරා යුවල ඉතා අගය කරමින් සිහිපත් කරති.

මැයි මස 22 දා සවස 6.00 ට ''රිංවුඩ්හි'' ජෝර්ජ්වුඩ් පර්ෆෝමිං ආට් සෙන්ටර්'' (George-wood Preforming Art Centre) හි පැවැත්වෙන ප්‍රසංගයේ මේ වෙනස විඳගැනීමට ඔබ සැමට සපැමිණෙන ලෙස රංගන , උදුම්බරා නර්තනාචාර්ය යුවල ආදරයෙන් ඇරයුම් කරති.

